ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අර්ධ වාර්ෂික සඟරාව








ශ්‍රී ලංකා මහ බැංකුව

# ප්‍රාදේශීය පුවත් - මාතර සඟරාව

2018 July - Dec

වෙළුම 3

9 87654 32109 8

# 1 ව්‍යවසායකයන්ට නව තාක්ෂණය හඳුන්වා දීම

වර්තමානයේ ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නව තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ ඇති නොදැනුවත්කම හා අවබෝධය අඩුකම එම ව්‍යාපාරවල වර්ධනයට ප්‍රධාන බාධාවක් වී ඇති බව අපගේ පසු විපරම් කටයුතුවල දී හඳුනා ගැනීම හැකි විය. ඒ අනුව ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මඟ පෙන්වීම යටතේ තෝරාගත් කර්මාන්තයන් හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර නව තාක්ෂණික දැනුම ලබා දීමේ වැඩසටහන් 02 ක් සංවිධානය කරන ලද අතර ඒ සඳහා සහභාගී වූ ව්‍යවසායකයන් සංඛ්‍යාව 59 කි.





## ඇසුරුම්කරණය පිළිබඳ නවීන තාක්ෂණික වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත්දායකත්වය ලබා ගනිමින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය බල ප්‍රදේශය තුළ සිටින මත්ස්‍ය නිෂ්පාදන කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සංවිධානය කරන ලද ඇසුරුම්කරණය පිළිබඳ නවීන තාක්ෂණික වැඩසටහන 2018 සැප්තැම්බර් මස 20 වන දින අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 24 ක් සහභාගී විය.





# 1 ව්‍යවසායකයන්ට නව තාක්ෂණය හඳුන්වා දීම

**_බතික් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ජාවා බතික් නිෂ්පාදනය පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන_**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත්දායකත්වය ලබා ගනිමින් කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය බල ප්‍රදේශය තුළ සිටින බතික් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සංවිධානය කරන ලද නවීන තාක්ෂණික වැඩසටහන 2018 සැප්තැම්බර් මස 25 සහ 28 යන දිනයන්හි දී කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සහ යටියන කෘෂිකර්ම සංවර්ධන පදනමේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන් සඳහා ව්‍යවසායකයන් 35 දෙනෙක් සහභාගී විය. එහිදී ඔවුන්ට නවීන තාක්ෂණය යොදා ගනිමින් ජාවා බතික් නිෂ්පාදනය සිදු කරනු ලබන ආකාරය පිළිබඳව සහ බතික් නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි ඉහළ ඉන්ධන කාර්යක්ෂමතාවයකින් යුක්ත නව උඳුනක් පිළිබඳ දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා ගැනීමට හැකියාව ලැබුණි.







# 2 යහපත් ව්‍යාපාරික පරිචයන් හඳුන්වා දෙමින්....

වර්තමානයේ වෙළඳපොල තුළ දක්නට ලැබෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ඇතැම් නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීම නීතිමය වශයෙන් අනිවාර්ය වුවත් ඒ පිළිබඳව ඇති නොදැනුවත්කම නිසා එම තත්ව සහතික ලබා නොගෙන නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම හේතුවෙන් ඔවුන් විවිධ නීතිමය ගැටලු වලට ලක්වන අවස්ථා බොහෝය. එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන පිළිගත් වෙළඳපොල වෙත ඉදිරිපත් කිරීමේ දී තත්ව සහතික ලබා නොතිබීම හේතුවෙන් එම නිෂ්පාදනවල තත්වය ඉහළ මට්ටමක පැවතිය ද ඒවා පිළිගත් වෙළඳපොල මගින් ප්‍රතික්ෂේප කෙරේ. ඒ අනුව, ඊට පිළියමක් වශයෙන් ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් මත එවැනි බලපෑමක් සහිත නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා **“SLS”** සහ **“GMP”** තත්ව සහතික ලබා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සම්පත්දායකත්වය ලබා ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා 2018 ජූලි මස 20 වන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 48 ක් සහභාගී විය. මෙම වැඩසටහන තුළින් තත්ව සහතික ලබා ගැනීමේ වැදගත්කම, එම සහතික ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සහ ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පිළිබඳව නිවැරදි හා විස්තරාත්මක කරුණු ව්‍යවසායකයන්හට දැන ගැනීමට හැකියාව ලැබුණු අතර ඒ තුළින් ඉදිරියේ දී ඔවුන්ගේ ව්‍යාපාරයන්හි සිදු කරනු ලබන නිෂ්පාදන නිසි ප්‍රමිතියකට අනුකූලව වෙළඳපොලට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.







# 3 නව දේශීය ආදායම් බදු පනත පිළිබඳ මාතරත් දැනුවත්

2017 වර්ෂයේ පාර්ලිමේන්තුවේ සම්මත කළ නව දේශීය ආදායම් බදු පනත පිළිබඳව ව්‍යවසායකයන් හා වෘත්තිකයන් තුළ නිරවුල් අවබෝධයක් නොමැති වීමෙන් ඔවුන් විවිධ දුෂ්කරතාවයන්ට ලක්වන බව අපගේ පසු විපරම් කටයුතුවල දී දැක ගත හැකි විය. ඒ අනුව, මෑතක දී පාර්ලිමේන්තුවේ දී සම්මත කළ 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනතේ ඇතුළත් කරුණු පිළිබඳව මාතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සහයෝගය ඇතිව සංවිධානය කළ නව දේශීය ආදායම් බදු පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 ජූලි 18 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ ධීවර හා සමුද්‍රීය විද්‍යා හා තාක්ෂණ පීඨ ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සම්පත්දායකත්වය ලබා දුන් අතර, වැඩසටහන සඳහා 274 ක පිරිසක් සහභාගී වූහ.












# 4 ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන්

හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ වැඩසටහන් මාලාවක් 2018 අගෝස්තු 20 දින වලස්මුල්ලේ මෙනාරා ගාඩ්න් හෝටලයේ දී. 2018 අගෝස්තු 30 දින තිස්සමහාරාමයේ සාකල්‍යා ලේක් වීව් හෝටලයේ දී සහ 2018 සැප්තැම්බර් 04 දින තංගල්ලේ පපා පැලස් හෝටලයේ දී සංවිධානය කරන ලදී. මෙහිදී ව්‍යවසායකයෙකු සතු විය යුතු ගුණාංග, නවෝත්පාදන සඳහා යොමු කිරීම, කාර්යක්ෂමතාවය ආදී බොහෝ පැතිකඩයන් ඔස්සේ දැනුවත් කිරීම් සිදු කරන ලදී. වැඩසටහන් ත්‍රිත්වය සඳහා සම්පත්දායකත්වය සපයනු ලබුවේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්.පී. අනුර මහතා විසිනි. වැඩසටහන් ත්‍රිත්වය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් 126 ක් පමණ සහභාගී විය.



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා
වලස්මුල්ල ප්‍රදේශයේ සාමාජිකයින්හට දේශනය පවත්වමින්



ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්.පී. අනුර මහතා
තිස්ස ප්‍රදේශයේ සාමාජිකයින්හට දේශනය පවත්වමින්





# 5 මධ්‍ය පරිමාණ තේ වැවිලිකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්

දකුණු පළාතේ සංවර්ධනය කළ යුතු ශක්‍යතාවක් සහිත ක්ෂේත්‍රයන් ලෙසට හඳුනාගෙන ඇති තේ කර්මාන්තය, සංචාරක කර්මාන්තය සහ රූපලාවණ්‍ය ක්ෂේත්‍රය නඟාසිටුවීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ අනුව මාතර දිස්ත්‍රික් මධ්‍ය පරිමාණ තේ වැවිලිකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් 2018 නොවැම්බර් මස 30 දින සංවිධානය කරනු ලැබීය. මෙම වැඩසටහන මොරවක ගුරුබැවුල කතාහල දී තේ වැවිලිකරුවන් 46 කගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදි. මෙහිදී මධ්‍යම පරිමාණ තේ වැවිලිකරුවන් සඳහා තේ වගා බිම්වල කෘෂිකර්මාන්තය විවිධාංගීකරණය සඳහා ඇති අවස්ථා පිළිබඳව දැනුම ලබාදීම, තේ වගා බිම් වල කෘෂිකර්මාන්තය විවිධාංගීකරණය කිරීම සඳහා මුදල් ලබා ගත හැකි විකල්ප පිළිබඳව දැනුවත් කිරීම සිදුකළ අතර "ගුරුබැවුල කතාහල" සහ ගුරුබැවුල තේ වතුයායේ ආදර්ශ ගොවිපොල අධ්‍යයනය කිරීමට ද වැවිලිකරුවන්හට අවස්ථාව සලසාදුනි.

වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයනු ලැබුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.එස්.කේ. ධර්මවර්ධන මහතා, රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්ය පී.එච්.එම්. ධර්මසේන මහතා සහ ගුරුබැවුල වතුයායේ හිමිකරු සතිෂ් අබේවික්‍රම මහතා විසිනි.



ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.එස්.කේ. ධර්මවර්ධන මහතා රැස්ව සිටි පිරිස අමතමින්



රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්ය පී.එච්.එම්. ධර්මසේන මහතා දේශනය පවත්වමින්



ගුරුබැවුල වතුයායේ හිමිකරු සතිෂ් අබේවික්‍රම මහතා දේශනය පවත්වමින්



ගුරුබැවුල වතුයායේ අධිකාරි එන්.පී.කේ. පද්මලාල් මහතා දේශනය පවත්වමින්

# ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්...



මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මධ්‍ය පරිමාණ තේ වැව්ලිකරුවන් සඳහා සංවිධානය කරන ලද "ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන" 2018 ජූලි මස 31 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී, තේ වැව්ලිකරුවන් 68 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. එයට සම්පත්දායකත්වය සපයන ලද්දේ රුහුණ විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන වයි.එම්.බී.ඒ. මානවංශ මහතා සහ කේ.ජී. ප්‍රියශාන්ත මහතා විසිනි. පහතරට තේ වැව්ලිකරුවන්ගේ සංගමය මෙම වැඩසටහන සංවිධානය කිරීම සඳහා සහයෝගය ලබා දුනි.



අකුරැස්ස ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් සඳහා "ව්‍යාවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාවය" පිළිබඳ වැඩසටහනක් 2018 අගෝස්තු මස 03 වන දින අකුරැස්ස උරුවෙල තේ කර්මාන්ත ශාලා පරිශ්‍රයේ දී ව්‍යාවසායකයන් 134 ක සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්විණි.



මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු ආයතනවලින් අධ්‍යාපනය නිම කළ සිසුන් සඳහා සංවිධානය කරන ලද "ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන" 2018 ඔක්තෝබර් මස 05 වන දින තලල්ල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා සිසුන් 112 දෙනෙකු සහභාගී විය. නිපෝන් ජේන්ට් ලංකා පුද්ගලික සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂ රාජා හේවාබෝවල මහතා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර එස්. හඳුන්ගේ මහතා විසින් මෙම වැඩසටහන සඳහා සම්පත්දායකත්වය සපයන ලදී.







මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පවත්වන ලද "ව්‍යවසායකත්ව සංවර්ධනය" පිළිබඳ වැඩසටහන 2018 නොවැම්බර් මස 14 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 41 ක් සහභාගී වූ අතර, සම්පත්දායකත්වය සපයන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර එස්. හඳුන්ගේ මහතා විසිනි. මෙම වැඩසටහන සංවිධානය කිරීමේ දී මාතර දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහයෝගය දක්වන ලදී.

# 7 ණය කඳවුරු

දකුණු පළාතේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින්ට තම ව්‍යාපාරික අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී පැන නගින මූල්‍යමය ගැටලු සඳහා විසඳුම් ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙන, මාතර ප්‍රාදේශීය කාර්යාලය ණය කඳවුරු සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහන් තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රදේශයේ සියළු වාණිජ බැංකු නියෝජනය කරමින් නියෝජිතයන් සම්බන්ධ කරනු ලබන අතර, ව්‍යවසායකයින්හට ඔවුන් ගණුදෙනු කරනු ලබන මූල්‍යායතනය සමඟ ඔවුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා වන මූලික කටයුතු පිළිබඳව සාකච්ඡා කරගැනීමට මෙහි දී හැකියාව ලැබේ. මාතර ප්‍රාදේශීය කාර්යාලය ණය කඳවුරු රාශියක් සංවිධානය කරනු ලැබූ අතර, ඉන් එක් වැඩසටහනක් මාතර, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2019.08.21 දින සාර්ථකව පවත්වන ලදී. මෙම ණය කඳවුර සඳහා ව්‍යවසායකයන් 60 ක් පමණ සහභාගී විය.







සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු
සුමුදු ගුණරත්න මහතා දේශනය පවත්වමින්



සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු
එම්.පී. අනුර මහතා දේශනය පවත්වමින්

# 8

# උකස්කරණය මත ණය දීම පිළිබඳ පුහුණු වැඩමුළුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජගිරිය බැංකු විදු පියෙස සමඟ ඒකාබද්ධව බැංකු සහ මූල්‍ය ආයතන නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද “උකස්කරණය මත ණය දීම” පිළිබඳ පුහුණු වැඩමුළුව 2018 අගෝස්තු මස 07 සහ 08 යන දිනයන් හි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා නිලධාරීන් 44 ක් සහභාගී විය. මෙහි සම්පත්දායකත්වය උකස් කටයුතු පිළිබඳ උපදේශක (විශ්‍රාමික බැංකු නිලධාරී)-යූ.වී.ගුණදාස මහතා විසින් ලබා දෙන ලදී.








# 9

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

අප මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2006 අංක 06 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීති සහ ඒ හා සම්බන්ධ අනෙකුත් රෙගුලාසි පිළිබඳ මාතර දිස්ත්‍රික්කයේ බැංකු නිලධාරීන්, මූල්‍ය ආයතන නිලධාරීන්, කොටස් තැරැව්කරුවන් සහ රක්ෂණ ආයතන නිලධාරීන් 96 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 අගෝස්තු මස 29 වන දින මහජන බැංකුවේ මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ, එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තු නේවාසික උපදේශක - කෙවින් වීලන්ඩ් මහතා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ - ර්. එච්. මොහොට්ටි මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ - ජී. සී. විජේසුන්දර මහතා යන නිලධාරීන් විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදී.

මෙම වැඩසටහන මගින් පහත කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී.

**1 - 2006 අංක 06 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මූල්‍ය ආයතනයන්හි කාර්යභාරය සහ 2016 අංක 01 දරණ මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ රීති**

**2 - සැක කටයුතු ගනුදෙනු හඳුනාගැනීම හා වාර්තා කිරීම**

**3 - ගනුදෙනුකරුවන් පිළිබඳ ප්‍රතිලාභී හිමිකරුවන් *(Beneficial Owners)* හඳුනා ගැනීම**

**4 - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් පනවා ඇති ත්‍රස්තවාදය වැළැක්වීම සහ ඉලක්කගත මූල්‍ය සම්බාධක**










# 10 ව්‍යාජ නෝට්ටු, චෙක්පත් අක්‍රමිකතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයන්, පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් සඳහා "ව්‍යාජ නෝට්ටු, චෙක්පත් අක්‍රමිකතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයන්" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 නොවැම්බර් මස 09 වන දින මාතර හේමාලී උත්සව ශාලා පරිශ්‍රයේ දී සාර්ථකව පැවැත්විණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී ඒ. ඩබ්ලිව්. ඒ. ආර්. සී. අබේසේකර මහතා නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජේ. ඒ. ඒ. පී. ජයසිංහ මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ එච්. පී. ඒ. අයි. ආරියසිංහ මහතා සම්පත්දායකත්වය දක්වන ලදී. මෙම වැඩසටහන සංවිධානය කිරීමේදී මාතර පොලිස් අධිකාරී පී.එච්.මාරපන මහතාගේ සහයෝගය ලැබිණි. එසේම මාතර පොලිස් අධිකාරී පී.එච්.මාරපන මහතා සහ මාතර මූලස්ථාන පොලිස් පරීක්ෂක ධම්මික මහතා ආරාධිත අමුත්තන් වශයෙන් සහභාගී විය.













# 11 ව්‍යාපාර පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට පළාත් මට්ටමින් වැඩි දායකත්වයක් ලබා දීමේ අරමුණින් කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී එම වැඩසටහන් සඳහා සහභාගී වූ ව්‍යවසායකයන් එම වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසු සිය ව්‍යාපාරික කටයුතුවල ධනාත්මක වෙනසක් අත්කරගෙන ඇති ද යන්න පිළිබඳ හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරයන්හි දිගු කාලීන වර්ධනය සඳහා සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබා දීමේ අරමුණින් පසු විපරමක් ද සිදු කරනු ලබයි. මෙහිදී අප විසින් ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථාන වෙත ගොස් එහි කටයුතු නිරීක්ෂණය කිරීම සිදු කර අප විසින් හඳුනාගන්නා ලද ඔවුන්ගේ ව්‍යාපාරයන් මුහුණ දෙනු ලබන ගැටළු හඳුනාගැනීමත් ඒ සඳහා වන විසඳුම් පිළිබඳව අවබෝධයක් ලබා දීමත් සිදු කරනු ලබයි.

## ***ගිහාන් අමරසේකර මහතාට අයත් සාගර බතික් ආයතනය***

*ගිහාන් අමරසේකර මහතාගේ මව, මොරටුව ජේෂකර්ම පුහුණු මධ්‍යස්ථානයෙන් බතික් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගෙන ඇති අතර, එම දැනුම පදනම් කරගෙන සේවකයන් දෙදෙනෙකු යොදා ගෙන 1995 වර්ෂයේ දී සාගර බතික් ව්‍යාපාරය සුළුවෙන් ආරම්භ කර ඇත. පසුව ක්‍රම ක්‍රමයෙන් සිය ව්‍යාපාරය දියුණු කර ගෙන ඇති අතර, ඒ තුළින් තවත් සේවකයන් කිහිප දෙනෙකුට රැකියා අවස්ථා ලබා දීමට ඔහුට හැකියාව ලැබී ඇත.*









# 11 ව්‍යාපාර පිළිබඳ පසු විපරම

## එච්. පී. චන්ද්‍රසේන මහතාට අයත් මූන්ලයිට් බතික් ආයතනය

චන්ද්‍රසේන මහතා බතික් නිෂ්පාදන ව්‍යාපාරයට යොමු වන්නේ සිය පවුලේ අභාශය තුළිනි. එනම් ඔහුගේ පියා දක්ෂ චිත්‍ර ශිල්පියෙකු වන අතර ඔහු විසින් ඉතා සුළු පරිමාණයෙන් මෙම බතික් නිෂ්පාදන ව්‍යාපාරය ආරම්භ කර ඇත. චන්ද්‍රසේන මහතාගේ පියාගේ තිබු කලාත්මක හැකියාවත්, බතික් කර්මාන්තය කෙරෙහි තිබු දැඩි උනන්දුවත් හේතු කර ගෙන ඔහුට සිය ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී ඇත. මේ වන විට මූන්ලයිට් බතික් ආයතනය විශාල පරිමාණයෙන් බතික් නිෂ්පාදනය සිදු කරනු ලබන ආයතනයක් ලෙස කටයුතු කරමින් පවතී.







## මෙම පසු විපරමේ දී හඳුනාගත් පොදු ගැටළු

1. දිනෙන් දින අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා ඇණවුම් සඳහා තරඟකාරී ලෙස මිල නියම කිරීමට අපහසු වීම.
2. මුදල් ප්‍රවාහ සැලසුම් කිරීමේ දී විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වීම සහ ඒ තුළින් මූල්‍ය පිරිවැය ඉහළ යාම.
3. අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මුදලක් (කාරක ප්‍රාග්ධනය) නොමැති වීම.
4. වර්තමානයේ මූල්‍ය වෙළඳපොලේ පොළී අනුපාත විශාල වශයෙන් ඉහළ යාම නිසා ආයතනයේ මූල්‍ය පිරිවැය ඉහළ යාම.
5. ප්‍රචාරක කටයුතු සඳහා ඉහළ වියදමක් දැරිය යුතු වීම.

# 11 ව්‍යාපාර පිළිබඳ පසු විපරම

## අදහස්, යෝජනා සහ මගපෙන්වීම්

01. පාරිභෝගිකයා වඩාත් ආකර්ෂණය වන ඇසුරුම්කරණයක් සිදු කිරීම.
02. බතික් ආශ්‍රිත නව ඇඳුම් විලාසිතා සහ මෝස්තරයන් හඳුනාගෙන ඒවා පාරිභෝගිකයා අතරට යැවීමට කටයුතු කිරීම.
03. නිෂ්පාදන අඛණ්ඩව පාරිභෝගිකයාට ලබා දීම සහ නිෂ්පාදන බෙදාහැරීම නිසි සැලැස්මක් අනුව සිදු කිරීම.
04. පාරිභෝගිකයාට පහසුවෙන් ළගා විය හැකි පරිදි සහ පාරිභෝගික ආකර්ෂණයක් ඇති වන පරිදි නිෂ්පාදන අලෙවිය සුදුසු ස්ථානයක් වෙත ගෙන යාම.
05. දැනට සේවයේ නිරත පුහුණු සේවකයන් ආයතනය තුළ රඳවා ගැනීම ඉතා වැදගත් වන බැවින් ඒ සඳහා **"Great Place to Work"** සංකල්පය ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.
06. අන්තර්ජාලය හරහා අලෙවිකරණය හා ප්‍රචාරණය සිදු කිරීමේ දී වඩා සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීම.
07. ව්‍යාපාරය ඩිජිටල්කරණයට ලක් කිරීමට කටයුතු කිරීම සහ ඩිජිටල් අලෙවි උපක්‍රම භාවිතා කිරීම.
08. ගිණුම්කරණ කටයුතු සඳහා නිසි අවධානයක් යොමු කර නිවැරදි ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යාම.
09. ආයතනයේ සමස්ථ ක්‍රියාවලිය සඳහාම 5S සංකල්පය ආදේශ කිරීමට කටයුතු කිරීම.
10. හැකි සෑම අවස්ථාවකම ව්‍යාපාරික ගණුදෙනු බැංකු ආයතන හරහා සිදු කිරීම.
11. වැඩි වශයෙන් විදේශ වෙළඳපොළ වෙත නිෂ්පාදන අලෙවි කිරීමට යොමු වීම.





# 12 මූල්‍ය සාක්ෂරතාවය , අනවසර මුදල් ව්‍යාපාර හා තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලාංකීය ජනතාවගේ සාක්ෂරතාවය ඉහළ තත්වයක පැවතියත් මූල්‍ය සාක්ෂරතාවය එතරම් යහපත් මට්ටමක නොපවතී. ඒ හේතුවෙන් තමා ඇතුළු පවුලේ සාමාජිකයන්ට වඩා හොඳ ජීවන තත්වයක් ලබා ගැනීම සඳහා මුදල් ඉපයීමට, වියදම් කිරීමට, ඉතිරි කිරීමට සහ ආයෝජනය කිරීමට ඔවුන් සතු දැනුම, ආකල්ප හා හැකියාවන් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. ඊට පිළියමක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් එවැනි බලපෑමක් සහිත ප්‍රදේශයන් හි ජීවත්වන මහජනතාව ඉලක්ක කරගෙන මූල්‍ය සාක්ෂරතාවය, අනවසර මුදල් ව්‍යාපාර හා තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබයි.

**මෙම වැඩසටහන් තුළ දී පහත කරුණු පිළිබඳව සහභාගීවූවන් දැනුවත් කරන ලදී.**

01. මුදල් නෝට්ටු හඳුනාගැනීම සහ පිරිසිදු මුදල් භාවිතය පිළිබඳ දැනුවත් කිරීම.
02. ආයෝජනය කිරීමට බලාපොරොත්තුවන අය නිතරම තමන්ට වාසිදායක කොන්දේසි යටතේ ණය ලබා ගත යුතු බව පෙන්වා දීම.
03. අනාගතය වෙනුවෙන් මුදල් ඉතිරි කිරීමේ වැදගත්කම පෙන්වා දීම.
04. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය, බලපත්‍රලාභී බැංකු හා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ එවායින් සපයනු ලබන සේවාවන් හඳුන්වාදීම.
05. මූල්‍ය පද්ධතිය තුළ පවත්නා විධිමත් හා අවිධිමත් මූල්‍ය ආයතන වෙන් කර හඳුනාගැනීම.
06. විධිමත් මූල්‍ය පද්ධතියක පවත්නා නීතිමය පරිසරය හඳුනාගැනීම.
07. තහනම් මූල්‍ය යෝජනා ක්‍රම වල හෝ අනවසර මුදල් ව්‍යාපාරවල මුදල් තැන්පත් කිරීමේ දී පවතින අවධානම හඳුනාගැනීම.
08. විධිමත් මූල්‍ය ක්‍රමයට ඇතුළු වීමෙන් මූල්‍ය ආයතනවලින් ලබා ගත හැකි ප්‍රයෝජන හඳුන්වාදීම.
09. අවිධිමත් මූල්‍ය වෙළඳපොලේ ක්‍රියාත්මක වන අධික පොලී සහිත ණය උගුලට හසුවීමෙන් සිදු විය හැකි මූල්‍ය පාඩු පෙන්වා දීම.
10. ආදායම වියදම් ලේඛනයක් සකස් කර ගැනීමෙන් ආදායම් වැඩි කර ගැනීමට ඇති හැකියාව හා නාස්තිය අවම කරමින් වියදම අඩු කර ගැනීමට ඇති හැකියාව පෙන්වා දීම.

**ඒ අනුව, මෙවැනි මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 දෙවන අර්ධ වර්ෂය තුළ අප විසින් සාර්ථකව පවත්වන ලදී.**






2018 ජුලි මස 05 වන දින බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී
**ඉලක්කගත කණ්ඩායම : බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ සිටින ප්‍රජාව - 118**
**සම්පත්දායකත්වය : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

# 12 මූල්‍ය සාක්ෂරතාවය , අනවසර මුදල් ව්‍යාපාර හා තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



**2018 ජූලි මස 06 වන දින ඇඹිලිපිටිය පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දී**

**ඉලක්කගත කණ්ඩායම** : ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ සිටින ප්‍රජාව - 82

**සම්පත්දායකත්වය** : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව






**2018 ජූලි මස 23 වන දින අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී**

**ඉලක්කගත කණ්ඩායම** : අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ සිටින ප්‍රජාව සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් - 114

**සම්පත්දායකත්වය** : එම්. පී. අනුර මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (සංවර්ධන), ප්‍රාදේශීය කාර්යාලය - මාතර, ශ්‍රී ලංකා මහ බැංකුව





# 13 අධ්‍යාපනික වැඩසටහන්

මාතර, ගාල්ල, හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්කයන් හි පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමට සහ මුදල් කෞතුකාගාරය නැරඹීම සඳහා වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලද අතර, මෙම වැඩසටහන්වල දී මහ බැංකුවේ කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ පවතින විධිමත් මූල්‍ය සේවාවන් පිළිබඳව ද දැනුවත් කිරීම සිදු කරන ලදී. වැඩසටහන් සඳහා සහභාගී වූ බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් මුදල් කෞතුකාගාරය නැරඹීමෙන් මුදලේ විකාශය පිළිබඳ ලැබූ දැනුම බෙහෙවින් අගය කරන ලදී.

මෙම වැඩසටහන් සඳහා 2018 දෙවන අර්ධ වර්ෂය තුළ දී පාසල් 20 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1126 ක් පමණ සහභාගී වී ඇති අතර, මාතර දිස්ත්‍රික්කයේ සුජාතා බාලිකා විද්‍යාලය, කොටවිල ශ්‍රී රතනපාල මහා විද්‍යාලය, දික්වැල්ල මින්හාත් ජාතික පාසල, කෝන්ගල අභය මහා විද්‍යාලය, වැලිගම ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය, තල්පාවිල මහා විද්‍යාලය, ශාන්ත තෝමස් බාලිකා මහා විද්‍යාලය, දෙයියන්දර ජාතික පාසල, කොටපොල සිසුමග අධ්‍යාපන ආයතනය යන පාසල් ද ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය, බෙන්තොට ඇලකාක ද්විතීක පාසල යන පාසල් සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල බාලිකා විද්‍යාලය, බෙලිඅත්ත රුහුණු විජයබා ජාතික පාසල, අම්බලන්තොට මාමඩල මහා විද්‍යාලය, ලුණුගම්වෙහෙර මහා විද්‍යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ උඩුගම මහා විද්‍යාලය සහ බලංගොඩ කොටවෙහෙරමංකඩ මහා විද්‍යාලය යන පාසල් වැඩසටහන් සඳහා සහභාගී වූහ.

මෙම වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය සපයනු ලැබුවේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්. පී. අනුර මහතා, කළමනාකාරිනී පුෂ්පා වීරරත්න මහත්මිය සහ කළමනාකරණ සහකාර ඒ.එස්.පී.පී. ශිරෝමාල් මහතා විසිනි.



ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා හ/තංගල්ල බාලිකා විද්‍යාලයීය ශිෂ්‍යාවන්හට දේශනය පවත්වමින්







# 13 අධ්‍යාපනික වැඩසටහන්



ජ්‍යෙෂ්ඨ කළමනාකරු සුමුදු ගුණරත්න මහතා මාර/දික්වැල්ල මින්හාත් ජාතික පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට දේශනය පවත්වමින්



කළමනාකරණ සහකාර ඒ.එස්.පී.පී. ශිරෝමාල් මහතා බලංගොඩ උඩගම මහා විද්‍යාලයීය පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා දේශනය පවත්වමින්




ජ්‍යෙෂ්ඨ කළමනාකරු එම්.පී.අනුර මහතා කරන්දෙණිය ජාතික පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා දේශනය පවත්වමින්







කළමනාකාරිනී පුෂ්පා වීරරත්න මහත්මිය මාතර සුජාතා බාලිකා විද්‍යාලයීය ශිෂ්‍යාවන්හට මුදල් කෞතුකාගාරය පිළිබඳ විස්තර කරමින්

# අධ්‍යාපනික වැඩසටහන්

**ප්‍රාදේශීය කාර්යාලය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා සහභාගී වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඔවුන්ගේ අදහස් සමරු සටහන් පුස්තකයෙහි සටහන් කරන්නට අමතක කළේ නෑ**

2018. 09. 06
ගා/ඇලකාක මහා විද්‍යාලය
[illegible]
2018 O/L

[illegible]

A.P. [illegible]
2019 A/L Batch
2018 O/L
G/Elakaka Secondary School.

VISITORS

2018, September 10

This is very important place for all students. From this event we can get important informations and developed our knowledge. Thanks for doing like those important useful events.

Nadia Gunasekara
2020 A/L
H/Ruhunu Vijayaba National College

VISITORS

Sri Lanka Maha Bankuwa Nirrabimata Pemini apa Sigala dena Sadarayen Piligath Oba Semata bohevin Sthuthiy. Commerce Subject ekata Adalava Apage Vishaya Dejuma Pulul kara genima Udesa Mema ayathanayen lebunu Sahayogaya Vishala Pituwahalk Veema gena Apage Hadapiri Sthuthiya mese puda karamu.

— From: G/Hapugala M.V.
Commerce Section.
Galle.

සුජාතා විද්‍යාලය, මාතර
2018. 07. 12
උසස් පෙළ වාණිජ විෂය ධාරාව හදාරන අපට මෙම මුදල් කෞතුකාගාරය නැරඹීම තුළින් අපගේ විෂය දැනුම පුළුල් කර ගැනීමට හැකි වුනා. මෙම අවස්ථාව ලබා දුන් සැමදෙනාටම [illegible] ස්තූතිය පුද කරමි.
2019 A/L
Commerce අංශ.

[illegible]

ස්තූතියි. [illegible]
2018/10/11 ගා/ [illegible]

2018. 10. 16

අපි මා/ ඇහැලගේ [illegible] මහා විද්‍යාලීය සිසු දරුවන් වෙමු. උසස් පෙළ වාණිජ විෂයය හදාරන සිසුසිසුවියන් ලෙස මුදල් කෞතුකාගාරය නැරඹීම තුලින් ලබාගත් දැනුම අතිශය ගුණාත්මක [illegible]. සියලුම කරුණු පැහැදිලි කරදුන් අප [illegible] මෙම අවස්ථාව ලබාදුන් මහ බැංකුවේ සියලුම කාර්යමණ්ඩලයට අපගේ හදපිරි ස්තූතිය පුද කරන්නෙමු.

මා/ඇහැලගේ ම.ම.වි.
2019/2020 A/L Batch

2018/10/26.

We are from Balangoda Udagama maha Vidyalaya. As Students of Commerce Section. We get many experences and Knowledge by watching from this Muceum. So we thank all of you.

R/B/ Udagama ම.V.
2019/2020 A/L Batch.

මා/ [illegible] මහා විද්‍යාලය.
2016. 07. 06.

වාණිජ දිනය නිමිත්තෙන පැමිණි අප මෙම ආයතනයෙන් බොහෝ දැනුම සම්භාරයක් ලබා ගත්තෙමු. විශේෂයෙන් අපිට අතීතයේ මෙන්ම වර්තමානයේ ද මුදල් ගැන විවිධ තොරතුරු [illegible] කර ගත්තෙමු. අප මෙවැනි අවස්ථාවක් ලබා දීම සඳහා අප විද්‍යාලයේ සියලු සිසුන් වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

2018 – මාර/ [illegible] 2018. 07. 25
[illegible]

# 14 අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන් හි පාසල් හා විශ්වවිද්‍යාල විසින් කරන ලද ඉල්ලීම් මත, ඔවුන් විසින් සංවිධානය කරනු ලැබූ අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන ඇතුළත් ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කරන ලදී. බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය විසින් සංවිධානය කරනු ලැබූ “ක්‍රිස්තුදේව ශිල්ප ප්‍රභා - 2018”, අධ්‍යාපනික ප්‍රදර්ශනය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මහ බැංකු ප්‍රකාශන ඇතුළත් ප්‍රදර්ශන කුටියක් 2018 ජුලි මස 08 සහ 09 යන දිනයන්හි දී එම විද්‍යාල පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වනු ලැබීය. එහි දී පාසැල් ගුරුභවතුන්, පාසල් ශිෂ්‍යයන් හා මහජනතාව දහසකට අධික පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන ඇතුළත් අපගේ ප්‍රදර්ශන කුටිය නරඹන ලදී. මීට අමතරව, මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පිරිස් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කළමනාකාරිනී (පරිපාලන) ආර්. එන්. හෙට්ටිආරච්චි මහත්මිය සහ කළමනාකාරිනී (සංවර්ධන) යූ. ඩබ්. ඒ. පී. කේ. වීරරත්න මහත්මිය විසින් ව්‍යාජ මුදල් හඳුනාගන්නා ආකාරය හා පිරිසිදු මුදල් නෝට්ටු භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳව සහ විධිමත් මූල්‍ය ආයතන හා සේවා පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලැබීය.







# 15 ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සේවක අර්ථසාධක අරමුදල් අංශයෙන් සිදුවන සේවය.

සේවක අර්ථසාධක අරමුදල් කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට පමණක් සීමා නොවී ප්‍රාදේශීය කාර්යාල දක්වා ව්‍යාප්ත වීම නිසා, එහි සාමාජිකයන්ට ප්‍රාදේශීය මට්ටමින් විශාල සේවා රැසක් ඉටු කරනු ලබයි. ගාල්ල, මාතර, හම්බන්තොට හා රත්නපුර දිස්ත්‍රික්කයන් හි සාමාජිකයන් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සේවය ලබා ගැනීම සඳහා දිනකට 100 - 150 ත් අතර ප්‍රමාණයක් පැමිණෙති. මීට ඉහත දී නම්, ජාතික හැඳුනුම්පත් අංක හා ගිණුම් සංශෝධන සිදු කර ගැනීම සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලයට යා යුතු වුවත් වර්තමානයේ දී මෙම කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කර ගත හැකි නිසා එම ප්‍රදේශවල මහජනතාවට ඉමහත් පහසුවක් වී ඇත.

කෘෂි ආර්ථිකය පදනම් කර ගත් ගාල්ල, මාතර දිස්ත්‍රික්ක දෙකෙහි, තේ, රබර් වගාව ප්‍රධාන ආදායම් මාර්ගය වේ. ඒ නිසා වතු කම්කරුවන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ගැටළු විශාල ප්‍රමාණයක් පවතී. එම ගැටළු නිරාකරණය කිරීම සඳහා වතු කළමණාකාරිත්වය සමඟ සාකච්ඡා කර, ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලබා දීම ද, අප කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

සේවක අර්ථසාධක අරමුදල මගින් වඩාත් ඵලදායී සේවාවන් සැලසීම සඳහා ජංගම සේවා තුළින් සාමාජිකයින් අතරට ගොස් කඩිනම් සේවා සැපයීම ද සිදු කරනු ලබන අතර පසුගිය කාලයේ දී පවත්වා ඇති ජංගම සේවා මගින් බොහෝ පිරිසකගේ ගැටළු නිරාකරනය කර දී ඇත. කොළඹ සහ පිට පළාත්වල සේවය කරන සහ සේවය කර ඇති බොහෝ පිරිසක් සාමාජික නම්, ජාතික හැඳුනුම්පත් අංක හා ගිණුම් සංශෝධන සිදු කර ගැනීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලයට පැමිණීමේ වැඩි ප්‍රවණතාවයක් මෑතක සිට දක්නට ලැබේ. ප්‍රාදේශීය කාර්යාලය මගින් එම කටයුතු කර ගැනීමට හැකි වීම ඔවුන් අගය කරනු ලබයි. 2019 වර්ෂයේ සිට නිවාස ණය අංක ඉවත් කිරීම හා දායක මුදල් කඩිනම් ගිණුම්ගත කිරීම ද ප්‍රාදේශීය කාර්යාලය හරහා සිදු කර දීම ආරම්භ කරන ලදි.සේවක අර්ථසාධක අරමුදල් ගැටළු කඩිනමින් විසඳා සාමාජිකයින් වෙනුවෙන් වඩාත් ඵලදායී සේවයක් ලබා දීම මාතර ප්‍රාදේශීය කාර්යාලයේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අපේක්ෂාවයි.





# 5S සංකල්පය මාතර අපිටත්..

ඵලදායිතාවය පිළිබඳ පංචවිධ සංකල්පය වන 5S ජපානයේ උපත ලද්දකි. මෙම සංකල්පය ජපානය තුළ ක්‍රමවත්ව හඳුන්වා දීමට පෙර ද බොහෝ ජපන් වැසියෝ එම සංකල්පය අතීතයේ සිටම ක්‍රියාත්මක කළෝය. නමුත් මෙය ඵලදායිතාවය ඉහළ නැංවීමේ ක්‍රමයක් ලෙස ප්‍රචලිත වුයේ ජපානය එය මහා පරිමාණයෙන්, විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමත් සමගය. 5S සංකල්පය උපයෝගී කර ගනිමින් ජපානය ඉතා ඉක්මනින් දියුණු වන අයුරු දුටු ආසියාතික කලාපයේ රටවල් වන සිංගප්පුරුව, මැලේසියාව, දකුණු කොරියාව, තායිවානය ආදී රටවල් ද මෙය අනුගමනය කරමින් ඉතා හොඳ ප්‍රතිපල ලබාගත්හ. 5S ලෙස හඳුන්වන්නේ ජපන් භාෂාවේ එන seiri, seiton, seiso, seiketsu හා Shitsuke යන වචන පහේ මුල් අකුරුයි.

**1. සංවිධිත බව** : seiri

මෙමගින් කියවෙන්නේ අනවශ්‍ය දේ ඉවත් කර අවශ්‍ය දේ ළඟ තබා ගන්නා ආකාරයයි.

මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් අවශ්‍ය හා අනවශ්‍ය ලෙස සියලුම ද්‍රව්‍ය වර්ග කරන ලදී. මෙසේ අනවශ්‍ය දේ ලෙස වෙන් කළ සියල්ල අනවශ්‍ය-සුළු හෝ වටිනාකමක් නැති-ඉතා පහසුවෙන් ඉවත් කළ හැකි, අනවශ්‍ය-වටිනාකමක් ඇති සහ වටිනාකමක් නැති-ඉවත් කිරීමට අපහසු ආදී ලෙස නැවත වර්ග කර සුදුසු පරිදි ඉවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

**2. සුපිළිවෙල** : seiton

ඉහතින් තෝරාගත් අවශ්‍ය සියල්ල පිළිවෙලකට සකස් කළ යුතු බව මෙයින් කියවේ.

අප මාතර ප්‍රාදේශීය කාර්යාලයේ, අවශ්‍ය ද්‍රව්‍ය නිසි ලෙස ස්ථාන ගත කර සෑම දෙයක් සඳහාම නිශ්චිත ස්ථානයක් වෙන් කර තිබේ. එම ස්ථානයේ වෙනත් කිසිදු ද්‍රව්‍යයක් තැබීම සිදු නොකරයි.

**3. සුපිරිසිදුකම** : seiso

පිළිවෙලකට තැබූ දේවල් ඉතාම පිරිසිදු තත්වයේ තැබිය යුතු බව මෙයින් කියවේ.

අප ප්‍රාදේශීය කාර්යාලය තුල දිනපතා බඩු භාණ්ඩ පිරිසිදු කිරීම, එසේ කිරීමට අපහසු භාණ්ඩ අවම ලෙස සතියකට දිනයක් හෝ යොදාගෙන පිරිසිදු කිරීම සිදු කරයි.

**4. සම්මිතිය** : seiketsu

ඉහත පියවර තුනේදී අනුගමනය කරන ලද සංවිධිත බව, සුපිළිවෙල, හා සුපිරිසිදුකම වැඩි දියුණු කරමින් අඛණ්ඩව ඉදිරියට ගෙන යාම මෙමගින් සිදු කෙරේ.

අප ද මෙය අඛණ්ඩව කරගෙන යන අතර කාර්යාලයේ අලංකාරය වැඩි කිරීමට මල් වැවීම සිදු කරමින් පවතී. තවද, අප ප්‍රාදේශීය කළමනාකරු විසින් නිරතුරුවම ප්‍රගතිය මැන බැලීමද සිදු කරයි. එමෙන්ම සෑම නිලධාරියෙකුටම තම අංශයේ ප්‍රගතිය රැක ගැනීමට වගකීමක් පැවරී තිබේ.

**5. ශික්ෂණය** : shitsuke

මෙමගින් අදහස් වන්නේ 5S සංකල්පය පිළිබඳව අන් අය දැනුවත් කිරීමයි.

අප විසින් මෙම 5S සංකල්පය ක්‍රියාත්මක කරගන්නා නිසා පිළිවෙලකට, ක්‍රමවත්ව වැඩ කටයුතු සිදුකර ගන්නා අතර වෙනදාට වඩා කාලය ඉතිරි වී තිබේ. මෙම වැඩසටහන පිළිබඳව මෙම විද්‍යුත් සඟරාව හරහා ඔබව දැනුවත් කිරීම ද ශික්ෂණයට අයත් පියවරකි.





# මාසික ධර්ම දේශනා මාලාව



ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යමණ්ඩලයේ සුභසාධනය උදෙසා ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් පරිදි මාසිකව පොහෝ දිනට පෙර දිනයේ ධර්ම දේශනා මාලාවක් පවත්වනු ලබන අතර, වෙහෙසකර රාජකාරී දිවියෙන් පැයකට අත් මිදී ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් සහ විශ්‍රාමික නිලධාරීන් මේ අවස්ථාවට ඒකාත්මික වේ.













# මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යමණ්ඩලයේ 2018 වසර තුල සිදුවූ වෙනස් වීම් තතු....



## උසස්වීම් ලද නිලධාරීන්....



අප ප්‍රාදේශීය කළමනාකාරතුමා මාණ්ඩලික (III) ((2)) ශ්‍රේණියට දෙසැම්බර් මස (14) වැනිදා උසස්වීම් ලබන ලදී



සංවර්ධන අංශ ප්‍රධානී සුමුදු ගුණරත්න මහතා ජනවාරි මස පළමු වෙනිදා, මාණ්ඩලික (II) ශ්‍රේණියට උසස්වීම් ලබන ලදී.



සංවර්ධන අංශයේ එම්.පී.අනුර මහතා අප්‍රේල් මස (12) වැනිදා, මාණ්ඩලික (II) ශ්‍රේණියට උසස්වීම් ලබන ලදී.

## ස්ථාන මාරුවීම් ලබා පැමිණීම...



නොවැම්බර් මස 01 දින, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (ආයතනික සේවා) ඩබ්ලිව්.ඩී.පී.ආරියතිලක මහත්මිය අප කාර්යාලයට නැවත එක්වන ලදී.



දෙසැම්බර් 26 දින දී, අධීක්ෂණ නිලධාරී එච්.පී.ජේ.එස්. සමරසිංහ මහතා අප කාර්යාලයට එක් වන ලදී.

# 19 සුහද හමුව

ශ්‍රී ලංකා මහ බැංකුව මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් දෙවන වරටත් සංවිධානය කළ සුහද හමුව 2018 නොවැම්බර් මස 03 වන දින වැලිගම මන්දාරා රෙසෝර්ට් හි දී ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණි. මෙම සුහද හමුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති කේ. ඩී. රණසිංහ මහතා සහභාගී විය. දිනය පුරාම පැවැත්වුන මෙම සුහද හමුව විනෝද ක්‍රීඩා, සුහද කථා, ගීත ගායනයන්ගෙන් හා නැටුම් තරගයන්ගෙන් වර්ණවත් විය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ දැනට සේවයේ නියුතු සියළුම නිලධාරීන්, ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් සහ විශ්‍රාමික නිලධාරීන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහභාගී විය. මෙවැනි සුහද හමුවක් සංවිධානය කිරීම පිළිබඳව සහ ඒ සඳහා විශ්‍රාමික නිලධාරීන් හා ඔවුන්ගේ පවුලේ සමාජිකයන් සම්බන්ධ කර ගැනීම පිළිබඳව ඔවුන් ප්‍රාදේශීය කළමනාකාරතුමාට ස්තූතිය පුද කරන ලදී.








# 19 සුහද හමුව

















# 19 සුහද හමුව




PHOTOGRAPHY BY
ADK
077 123 5450






PHOTOGRAPHY BY
ADK
077 123 5450

# 20

# " වියපත් අම්මා "

අවලංගු කාසියක් ලෙස - සමාජය බැහැර කළ ද අද
පවතින තුරු මා ජීවය - බැහැර කළ නොහැක මාහට ඔබ
ධෛර්යය සම්පන්නව - කුරිරු සමාජය හමුවේ
රැකගෙන තම පතිවත - ඔසවා තැබීය දරුකැල සමාජය තුල
සිඟන්නන් නෑ හිතවතුන් - සියල්ලන්ටම හැකි ලෙසින්
පිහිට වූ වග, සරණ වූ වග - ඔබට නෑ අද මතකයේ
වැහැරුන ද ගතින් ඔබ - මතකයන් සවියක්ය අපට දිවිතුරාවට
ජීවිත රඟමඩලේ රඟදැක් වූවා - භූමිකා සියල්ල සාර්ථකව
රැස්කළා පින්පෙත් - හැකි සෑමවිට
මතුත් මිනිස් භවයක්ම ලැබේවා ! ඔබට- රැස්කරන්නට පින්
ලබන්නට මතුභවයක - අමා මහ නිවන් සුව



ආර්. එන්. හෙට්ටිආරච්චි
ප්‍රාදේශීය කාර්යාලය - මාතර